# සිංහ සේවාවේ බලපෑම මැනීම

**අපගේ ක්‍රියාකාරකම් අන් අය හා බෙදා හදා ගැනීම සදහා අපගේ සේවාව මගින් ඇතිකර තිබෙන බලපෑම වාර්තා කිරීමෙන්, අපගේ සංවිධානය එක්සත්වීමත්, අපගේ ප්‍රජාව උද්යෝගිමත් වීමත් සහ අප ගෝලීය වශයෙන් අවධානයට ලක්වීමත් සිදුවේ.**

**සේවා වාර්තාකරණය පිළිබද මෙම මාර්ගෝපදේශණයෙහි අඩංගු කරුණු:**

**1.** **සිංහයින් සහ ලියෝවරුන් සදහා සේවාව අර්ථදැක්වීම.**

**2.** **ඔවුන්ගේ සේවාවෙහි බලපෑම මිනිය හැකි විවිධ ක්‍රම පැහැදිලි කිරීම.**

**3.** **සේවාලාභීන් සංඛ්‍යාව ගණනය කරන අයුරු පිලිබදව උපදෙස් ලබාදීම.**

An adaptation of the Lions International publication, ‘Measuring service impact for Lions’

Adapted by; Lion Saman Liyanage MJF FDI

GST District Coordinator 2023/24, District 306 A2.

# සේවාව යනු කුමක්ද ?

## සිංහයන් සහ ලියෝවරුන් පහත දක්වෙන කරුණු ඇතුළුව බොහෝ ආකාරවලින් සේවය කරති :

**සේවා ක්‍රියාකාරකම්:** රුක් රෝපණය, අක්ෂි පරීක්ෂාව, ආපදාවලින් පසු නිවාස නැවත ගොඩනැගීම හෝ අවශ්‍ය අයට ආහාර සැපයීම වැනි ප්‍රයෝගික සේවා ක්‍රියාකාරකම්.

**උපදේශනය:** සිංහයින්ට වැදගත් වන කරුණු සම්බන්දව දැනුවත් කිරීම්, ප්‍රජාවට බලපාන ගැටළු සම්බන්දව අධ්‍යාපනය ලබාදීම, ප්‍රජාව සවිබලගැන්විමට සහ සහ ධනාත්මක වෙනසක් ඇතිකිරීම සඳහා අන් අය සමග කටයුතු කිරීම. උදාහරණ වශයෙන් අධ්‍යාත්මික හා පෞරුෂ සංවර්ධන සහ නායකත්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම. විවිධ වෘත්තීන්, ව්‍යාපාර සහ කර්මාන්ත කිරීමට මගපෙන්වීම සහ පහසුකම් සම්බන්ධීකරණය කිරීම, දියවැඩියාව සම්බන්ධව දැනුවත් කිරීමේ පාගමන්, දෘෂ්‍යාබාධිතයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා උපදෙස් ගැනීම ආදිය සඳහන් කළ හැකිය.

**පරිත්‍යාග:** පුද්ගලයින්ට හෝ සිංහ සමාජ ජාත්‍යන්තර පදනම (LCIF) වැනි සංවිධාන වලට පුණ්‍යාධාර කිරීම. ප්‍රජාව සවිබලගැන්වීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම. LCIF වෙත කරනු ලබන පරිත්‍යාග එම පදනම මගින් නිරීක්ෂණය කෙරෙන බැවින් සේවා ක්‍රියාකාරකමක් ලෙස වාර්තා කිරීමට අවශ්‍ය නොවේ.

**අරමුදල් රැස්කිරීම:** අපගේ සේවා සිදුකිරීම සඳහා අරමුදල් රැස්කිරීම.

**සේවා සහය ක්‍රියාකාරකම්:**

මෙයට පුළුල් කාණ්ඩ හතරක් ඇතුලත්ය:

1. ඔබේ සිංහ සමාජය ශක්තිමත් කිරීමට, සාමාජිකයින්ට අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීමට, හෝ වෙනත් සේවා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා රැස්වීම් පැවැත්වීම.
2. සාමාන්‍ය ලිපි කටයුතු, සිංහ සමාජයේ සන්නිවේදන කටයුතු, හෝ වාර්තා කිරීම් වැනි පරිපාලනමය කාර්යයන් ඉටුකිරීම.
3. සම්මේලන සහ රැස්වීම් වැනි සිංහ අංගයන්ට සහභාගී වීම.
4. අනෙකුත් සිංහයින් සමග සහයෝගයෙන් විනෝද කටයුතුවලට සහභාගී වීම.

**මෙවැනි කටයුතු තුළින් සිංහ සමාජ වලට ලැබෙන විවිධ ධනාත්මක ප්‍රතිඵල:**

- නව සාමාජිකයින් ආකර්ශනය වීම.
- දැනට සිටින සාමාජිකයින් හට ලැබෙන ධනාත්මක අත්දැකීම සහ ආත්ම අභිමානය ඔවුන් රඳවා ගැනීමට උපකාරී වීම.
- සිංහයින් සේවය කිරීමට සූදානම් කිරීම හෝ සෘජුවම සේවාලාභීන්ට ප්‍රතිලාභ ලැබීම.

### වාර්තා කළ නොහැකි සේවා මොනවාද ?

බොහෝ සිංහයින් ඔවුන්ගේ සිංහ සමාජයෙන්, දිස්ත්‍රික්කයෙන් හෝ බහුමණ්ඩලයෙන් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වලට පරිබාහිරව පෞද්ගලිකව තම ප්‍රජාවට සේවය කරති. උදාහරණ ලෙස, අසල්වැසියෙකුට අහාර වේලක් ලබාදීම, දෙමාපියෙක් වෛද්‍යවරයෙක් වෙත ගෙනයාම, හෝ පූජනීය ස්ථානයක ස්වේච්ඡා කටයුතු සිදුකිරීම සැලකිය හැකිය.මෙවැනි කටයුතු වැදගත් සහ ප්‍රසංශනීය වුවත් ඒවා සිංහ සේවා ලෙස වාර්තා නොකළ යුතුය.

එමෙන්ම  සිංහ සමාජ මගින් සේවාවන් සැපයීමේදී අවශ්‍යතා ඇති අයටම තම සේවාවන් සැලසීමට ප්‍රමුඛත්වය දිය යුතුය. ඒ අනුව සිංහ සමාජ මගින් සිදුකරනු ලබන ආගමික ස්ථානවල නව ඉදිකිරීම්, සාංගික දානයන් හෝ වෙනත් ආගමික පුද පූජා කටයුතු සිංහ ක්‍රියාකාරකම් ලෙස වාර්තා නොකළ යුතුය.

එසේ වුවත්, ආගමික ස්ථාන හෝ වැඩිහිටි නිවාස වැනි තැන්වල අත්‍යවශ්‍ය යැයි හැගෙන හදිසි නඩත්තු කටයුත්තක් හෝ අහාර සැපයීමක් වැනි ක්‍රියාකාරකමක් සිදුකර එය අදාල තේමාවන් යටතේ වාර්තා කළ හැකිය. මේ සම්බන්දව පැහැදිලි කිරීමක් අවශ්‍ය වන විටෙකදී ගෝලීය සේවා කණ්ඩායම් (GST) දිස්ත්‍රික් සම්බන්ධීකාරකගෙන් හෝ දිස්ත්‍රික් සිංහාධිපතිගෙන් උපදෙස් ලබාගන්න.

# ප්‍රමිතික (Metrics)

### සිංහයින් සහ ලියෝවරුන් ඔවුන්ගේ සේවා බලපෑම මනින අයුරු

මේවා ප්‍රමිතික ලෙස හැදින්වේ. ලොව පුරා සිටින සියළුම සිංහයින්ට  ඔවුන්ගේ සේවා වාර්තා කිරීමට සහ තම සේවාවන් සුවිසල් ගෝලීය බලපෑම සඳහා දායකවන අයුරු දැනගැනීමට ප්‍රමිතික උපකාරී වේ.

## සිංහ ජාත්‍යන්තරය විසින් දැනට එක්කර ඇති ප්‍රමිතික වලට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- **ක්‍රියාකාරකම් ගණන**

සිංහ සමාජයක්, දිස්ත්‍රික්කයක් හෝ බහුමණ්ඩලයක් වාර්තා කරනලද සෑම ක්‍රියාකාරකමක්ම වෙන් වෙන්ව ගණන් ගැනේ.

- **සේවාලාභී පුද්ගලයින් ගණන**

සිංහ සේවාවේ ඍජු ප්‍රතිලාභීන් මීට ඇතුලත් වේ. සමහරවිට ප්‍රතිලාභීන් නිශ්චිතව ගිණිය හැකි අතර එම ගණන ඇස්තමේන්තු කළ යුතු අවස්ථාද වේ.

- **ස්වේච්ඡා සාමාජිකයින් ගණන**

සේවා ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහභාගී වූ පුද්ගලයින් ගණන. සිංහයින් බොහෝවිට තම සේවා ක්‍රියාකාරකම් සඳහා හිතවතුන්වද ආරාධනා කරන බැවින්, ස්වේච්ඡා සාමාජිකයින් ගණනට සිංහයින් මෙන්ම සිංහයින් නොවන අයද ඇතුලත් විය හැකිය.

- **ස්වේච්ඡා පැය ගණන**

සේවා ව්‍යාපෘතිය සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට වැයවූ පැය ගණන.

- **රැස්කළ අරමුදල්**

සේවා ක්‍රියාකාරකම් හෝ පුණ්‍යාධාර සඳහා එකතු කරන ලද අරමුදල් ප්‍රමාණය. මෙය සිංහයින්ගේ පුද්ගලික දායකත්වයන් මෙන්ම අරමුදල් රැස්කිරීමේ අවස්ථාවකදී බාහිර පුද්ගලයින්ගෙන් හෝ ආයතන වලින් ලැබුණු අරමුදල්ද විය හැකිය.

- **පරිත්‍යාග කරන ලද අරමුදල්**

පුද්ගලයෙකුට හෝ සංවිධානයකට කරන ලද පුණ්‍යාධාර. LCIF වෙත කරන ලද පරිත්‍යාග එම පදනම මගින් නිරීක්ෂණය කෙරෙන බැවින් එය සේවා ක්‍රියාකාරකමක් ලෙස වාර්තා කිරීම අවශ්‍ය නොවන නමුත් එම අරමුදල් රැස් කිරීම සඳහා යම් ක්‍රියාකාරකමක් සිදුකළේනම් එය අරමුදල් රැස්කිරීමේ ක්‍රියාකාරකමක් ලෙස වාර්තා කළ හැකිය.

## සේවා ව්‍යාපෘතියේ වර්ගය අනුව, මෙම ප්‍රමිතික, සේවා වාර්තාකරණය සඳහා අනිවාර්ය හෝ වෛකල්පික වේ. පහත වගුවෙන් එය පැහැදිලි කෙරේ.

| | | රැස්කරගත් ප්‍රමිතික | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ක්‍රියාකාරකම් ගණන | සේවාලාභීන් ගණන | ස්වේච්ඡා සාමාජිකයින් ගණන | ස්වේච්ඡා පැය ගණන | රැස්කළ අරමුදල් | පරිත්‍යාග කරන ලද අරමුදල් |
| **ක්‍රියාකාරකම් වර්ගය** | සේවා | අනිවාර්ය | අනිවාර්ය | අනිවාර්ය | අනිවාර්ය | වෛකල්පිත | වෛකල්පිත |
| | අරමුදල් රැස්කිරීම | | වෛකල්පිත | වෛකල්පිත | වෛකල්පිත | අනිවාර්ය | වෛකල්පිත |
| | පරිත්‍යාග | | වෛකල්පිත | වෛකල්පිත | වෛකල්පිත | වෛකල්පිත | අනිවාර්ය |
| | රැස්වීම් | | වෛකල්පිත | අනිවාර්ය | අනිවාර්ය | වෛකල්පිත | වෛකල්පිත |

සේවා ක්‍රියාකාරකමක් සඳහා ප්‍රතිලාභීන් ගණන, ස්වේච්ඡා සාමාජිකයින් ගණන සහ ස්වේච්ඡා පැය ගණන වාර්තා කිරීම අනිවාර්ය වේ. ක්‍රියාකාරකම අතරතුරදී අරමුදල් රැස්කිරීමක් හෝ පරිත්‍යාගයක් සිදුවුයේනම් එය වාර්තාකිරීම වෛකල්පිත වේ.

ඉහත ලැයිස්තුගත කර ඇති ප්‍රමිතික වලට අමතරව සේවා බලපෑම මැනීමට තවත් බොහෝ ක්‍රම ඇත. නිදසුන් වශයෙන්, ලේ දන්දීමේ වැඩසටහනකදී එකතුවූ රුධිරය ලීටර් ප්‍රමාණය හෝ ආහාර හෝ ඇඳුම් එකතුකිරිමකදී එකතුකරන ලද අයිතම ගණනය කළ හැකිය.

සේවාවන් තුළින් ජනිත වන ඇතැම් ප්‍රතිඵල ප්‍රාමාණික වශයෙන් ගිණිය නොහැකි වුවත්, ඒවා ක්‍රියාකාරකම වාර්තා කිරීමේදී එහි විස්තරය තුළ අඩංගු කිරීම වැදගත් වේ. එවැනි ප්‍රතිඵල ලෙස රැකියා උත්පාදනය, පොදු ස්ථාන අලංකරණය වීම, ප්‍රජාව අතර සිංහ කීර්තිනාමය වර්ධනය වීම, සිංහ සමාජයකට නව සාමාජිකයින් ආකර්ශණය වීම යනාදිය සැලකිය හැකිය.

## සේවාව තුළින් සමාජිකත්ව ප්‍රවර්ධනය

සේවාව >> ප්‍රවර්ධනය >> සාමාජිකත්වය >> නායකත්වය >> සේවාව

අප සංවිධානයේ අරමුණු කරා යෑමේදී සාමාජිකත්ව වර්ධනය ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. සිංහයින් ලෙස අප සෑම විටම නව සාමාජිකයින් අප හා සම්බන්ධ කර ගැනීමට උත්සුක විය යුතුය. මේ සඳහා ප්‍රවර්ධන මෙවලමක් ලෙස අපගේ සේවා ක්‍රියාකාරකම් ඉතා පහසුවෙන් යොදාගත හැකිය. සේවාවන් සිදුකරන අතරතුරදී මෙන්ම සේවාවේ සාර්ථකත්වය සමාජය හා බෙදා හදා ගැනීමේදීද, නව සාමාජිකයින් ආකර්ෂණය කරගැනීමට සැලසුම් කල යුතුය.

මේ සඳහා සිංහ සේවාව සම්බන්ධව අත්දැකීමක් ලබාදීමේ අරමුණින් බාහිර පුද්ගලයින් සහ සංවිධාන ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කරගත හැකිය. එමෙන්ම අපගේ සේවාව ප්‍රචලිත කිරීම සඳහා සිංහ සමාජයේ මෙන්ම සිංහ දිස්ත්‍රික්කයේ ප්‍රවර්ධන නිලධාරීන් සහ මාධ්‍ය ඒකකය සමග එක්ව කටයුතු කිරීම සහ සමාජ මාධ්‍ය, ජන මාධ්‍ය ආදිය ඵලදායීව භාවිතාකිරීමද අවශ්‍ය වේ.

## ප්‍රතිලාභීන් සංඛ්‍යාව ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශ

සේවා වාර්තාකරණයයෙහි නිවරද්‍යතාවය හා සංගතතාව සුරක්ෂිත කිරීම සඳහා සිංහ ජාත්‍යන්තරය මාර්ගෝපදේශයන් සපයා ඇත. කෙසේවෙතත් සිංහයින් සහ ලියෝවරුන් ඔවුන්ගේ සේවාව පිළිබඳ සැබෑ විශේෂඥයින්වන බැවින් සේවා බලපෑම මැනීමේදී ඔවුන්ගේ අත්දැකීම් මත විශ්වාසය තැබිය යුතු අතර, හැකි සෑම විටම ඔවුන් ප්‍රාදේශීය විශේෂඥයින් සමග කටයුතු කිරීමට දිරිමත් කරනු ලැබේ.

## පියවර 1

### ඔබේ ක්‍රියාකාරකම සඳහා ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනිවාර්ය ප්‍රමිතිකයක්දැයි තීරණය කරන්න.

සේවා ක්‍රියාකාරකම් සඳහා පමණක් ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනිවාර්ය වේ. යම් සිංහ සමාජයක්, දිස්ත්‍රික්කයක් හෝ බහුමණ්ඩලයක්, ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෛකල්පිය ලෙස වාර්තාකරන බොහෝ අවස්ථා තිබේ. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රතිලාභීන් දන්නා සහ පැමිණ සිටින, අරමුදල් රැස්කිරීමේ ක්‍රියාකාරකමක්. නිදසුනක් ලෙස, සිංහ සමාජයක් විශ්ව විද්‍යාල සිසුන් පස්දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව අරමුදල් රැස්කිරීම. අදාල සිසුන් එම ශිෂ්‍යත්ව එම අවස්ථාවේදී ලබාගන්නේනම්, ප්‍රතිලාභීන් ගණන පහක් ලෙස වාර්තා කල හැකිය.
- සේවාලාභීන් සංඛ්‍යාව දන්නා පරිත්‍යාගයක්. නිදසුන් ලෙස වැඩිහිටි නිවාසයක නේවාසිකයින් දෙදෙනෙකු සඳහා රුපියල් විසිදහසක මුදලක් පරිත්‍යාග කළේ නම් සේවා ලාභීන් සංඛ්‍යාව දෙකක් ලෙස වාර්තා කළ හැකිය.
- රැස්වීමක් අතරතුරදී සිදුකරන ලද ක්‍රියාකාරකමක්. නිදසුනක් ලෙස මාසික රැස්වීමේදී අවශ්‍යතා ඇති පවුල් සඳහා වියලි සලාක මලු 50ක් සකස් කළේ නම් එක පවුලක සාමාජිකයින් හතරදෙනෙකු ඇතැයි සලකා ප්‍රතිලාභීන් 200ක් වාර්තා කල හැකිය.

## පියවර 2

### සේවාලාභීන් ඍජුව ගණනය කළ හැකිදැයි තීරණය කරන්න.

**එසේ ගිණිය හැකිනම් සේවා ක්‍රියාකාරකම අතරතුරදීම ඒ පිලිබඳව වාර්තාකරගන්න. එසේ නොකළහොත්, ඔබට එය පසුව තක්සේරු කිරීමට සිදුවනු ඇත.**

සේවාලාභීන් සමග සිටින අතරතුර එම සංඛ්‍යාව පහසුවෙන්ම ගණනය කළ හැකිය. නිදසුන: ශිෂ්‍යයින් සඳහා නායකත්ව පුහුණු වැඩසටහනකදී සහභාගිවී සිටින සිසුන් ගණන් කිරීම.

පරිසර සේවා ව්‍යාපෘතිවලදී සේවාලාභීන් සංඛ්‍යාව තක්සේරු කිරීමට අවශ්‍ය වනු ඇත. මෙහිදී පළමුවෙන්ම ප්‍රතිලාභීන් කවුරුන්දැයි තීරණය කළ යුතුය.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව තක්සේරු කිරීමට ක්‍රම කිහිපයකි. ඉන් සමහරක් පහත පරිදිය.

- සංගණන දත්ත වැනි ප්‍රසිද්ධ කර ඇති තොරතුරු සොයා බලන්න. මේවා අන්තර්ජාලයෙන් ද සොයාගත හැකිය.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පුණ්‍යායතන, පාසල්, වාණිජ මණ්ඩල ආදී තැන්වලින් උපදෙස් ගන්න.
- යම් බාහිර සංවිධානයක ක්‍රියාකාරකමකට ඔබ අනුග්‍රහය දක්වන්නේ නම්, ඔබේ දායකත්වයට අදාල ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඔවුන්ගෙන් අසා දැනගන්න.
- නිරීක්ෂණය මත පදනම්වූ තක්සේරුව. නිදසුන: ඔබ වෙරළ පිරිසිදු කරන දිනයේදී එහි පැමිණෙන පුද්ගලයින් ගණන.

## පියවර 3

### ඔබගේ ක්‍රියාකාරකම එක වරක් පමණක් සිදුකරන්නක්ද, නැවත-නැවතත් සිදුකරන්නක්ද එසේ නැතහොත් දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කරන්නක්ද යන්න තීරණය කර ඒ අනුව ප්‍රතිලාභීන් වාර්තා කරන්න.

එක් වරක් පමණක් සිදුකරන ක්‍රියාකාරකමක් සම්පූර්ණ කිරීමට දින කිහිපයක් වුවද ගතවීමට ඉඩ ඇත. මෙහිදී ප්‍රතිලාභීන්ට සේවය සැපයෙන්නේ එක්වරක් පමණි. මෙය නැවත-නැවතත් සිදුවන්නේ නැත. නිදසුන: සිංහයින් විසින් දියවැඩියාව පිලිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනකට පුද්ගලයින් 200ක් සහභාගී වුයේ නම් සේවාලාභින් ගණන 200 ලෙස වාර්තා කරන්න.

පුනරාවර්ති ක්‍රියාකාරකම් යනු නිතිපතා සිදුකරනු ලබන ක්‍රියාකාරකම්ය. නිදසුන: මසකට වරක් රෝහල් වාට්ටුවක් පිරිසිදු කිරීම. මෙහිදී එක පිරිසිදු කිරීමේ වාරයක් එක ක්‍රියාකාරකමක් ලෙස වාර්තා කළ හැකි අතර එදිනට එම වාට්ටුවේ සිටි රෝගීන් ගණන සේවාලාභීන් සංඛ්‍යාව ලෙස වාර්තා කල හැකිය.

දීර්ඝ කාලීන ක්‍රියාකාරකම් ලෙස සැලකෙන්නේ සිංහයින්ගේ දායකත්වය අසීමිත සේවාලාභීන් ප්‍රමාණයකට සැපයෙන අවස්ථාවන් වේ. යටිතල පහසුකම් ගොඩනැගීම සහ ප්‍රාග්ධන ආයෝජන මීට ඇතුලත්වේ.

- දීර්ඝ කාලීන ක්‍රියාකාරකම් වාර්තා කිරීමේදී එක් එක් සේවා වාර්තාව සඳහා වඩාත් ගැලපෙන කාල රාමුව තීරණය කරන්න. මෙය මාසික, කාර්තුමය හෝ වාර්ෂික විය හැකිය.
- අදාල කාල පරාසය තුළ ප්‍රතිලාභ ලැබූ සේවාලාභීන් පමණක් ගණනය කර සේවාව වාර්තා කරන්න. නිදසුනක් ලෙස සිසුන් 100 ක් සිටින පාසලක දීර්ඝ කාලීන ක්‍රියාකාරකමක් වාර්ෂිකව වාර්තා කළ හැකි අතර, එක වසරක් සඳහා සේවාලාභින් ගණන 100 ක් ලෙස වාර්තා කළ හැකිය.
- නිරන්තරයෙන් සිංහයින්ගේ සේවය අවශ්‍ය නොවන, රෝහලකට පරීක්ෂණ යන්ත්‍රයක් සවිකරදීම වැනි ක්‍රියාකාරකමකදී නිවැරදි සේවාලාභීන් සංඛ්‍යාව ගණනය කිරීමට අදාල ආයතනයෙන් යාවත්කාලීන තොරතුරු ලබාගන්න.
- දීර්ඝ කාලීන ක්‍රියාකාරකම සඳහා නිරන්තර නඩත්තුවක් අවශ්‍ය වන්නේනම්, එම ක්‍රියාකාරකම දිගටම වාර්තා කිරීමට නම් සිංහයින් එම කටයුත්තෙහි සක්‍රීයව යෙදීසිටිය යුතුය. නිදසුන් ලෙස ළමා උද්‍යානයක් පවත්වාගෙන යාම, පානීය ජල ව්‍යාපෘති ආදිය සැලකිය හැකිය. මේ සඳහා කෙරෙන ආයෝජනය තවදුරටත් ක්‍රියාත්මක නොවන්නේ නම් එම ක්‍රියාකාරකම තවදුරටත් වාර්තා නොකළ යුතුය.

## විශේෂයෙන් සැලකියයුතු කරුණු

### පාවිච්චි කරනලද ඇස් කන්නාඩි එකතු කිරීම සහ පරිත්‍යාග කිරීම

පාවිච්චි කරන ලද ඇස් කණ්නාඩි පරිත්‍යාග කිරීම තුලින් කී දෙනෙකුට සේවාවක් සැලසේන්නේදැයි දැනගැනීම දුෂ්කර විය හැකිය. සමහර අවස්ථා වලදී සේවාලාභියාට ලැබෙන ඇස් කණ්නාඩිය නිවැරදිව ගැලපෙන අතර සමහරවිට එහි කොටස් භාවිතයට ගන්නා අවස්ථාද ඇත. මෙම තොරතුරු නිවැරදිව ලබාගෙන වාර්තා කිරීම කළ යුතුය.

### සිංහ සමාජ කිහිපයක් ඒකාබද්ධව සේවාවන් කිරීම.

මෙහිදී ක්‍රියාකාරකම වාර්තාකිරීමට අවතීර්ණ වන ආකාරය පිලිබඳව සහභාගිවන සිංහ සමාජ සාකච්ඡා කළ යුතුය. යම් සිංහ සමාජයක් ක්‍රියාකාරකම සැලසුම් කර එහි වැඩි වැඩකොටසක් සිදුකළේ නම් එම සිංහ සමාජය මගින් පමණක් එම ක්‍රියාකාරකම වාර්තා කිරීමට එකගතාවයට ඒමට හැකිය. එසේ නැතහොත් සියලු සිංහ සමාජ සේවාලාභීන් සංඛ්‍යාව නිසි පරිදි බෙදාගෙන වාර්තා කළ හැකිය. මෙහිදී එකම ප්‍රතිලාභීන් නැවත-නැවතත් වාර්තා කිරීමෙන් වැළකිය යුතුය.

### දිස්ත්‍රික්කයෙන් හෝ බහුමණ්ඩලයෙන් නිර්දිෂ්ඨ ක්‍රියාකාරකම්.

දිස්ත්‍රික්කයෙන් හෝ බහුමණ්ඩලයෙන් යම් සිංහ වර්ෂයක් තුළ සියළු සිංහ සමාජ සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් නිර්දේශ කරන අවස්ථා ඇත. නිදසුනක් ලෙස, සිංහාධිපතිතුමා සියළු සිංහ සමාජ මගින් දියවැඩියා පරීක්ෂණ කෙරෙහි අවධානය දක්වන ලෙස ඉල්ලා සිටිය හැකිය. එවන් කටයුතු සිංහ සමාජ මට්ටමෙන් කරන ලද ඒවා ලෙස වාර්තා කල යුතුය. මෙවැනි ක්‍රියාකාරකම් වාර්තා කිරීමේදී හඳුනාගැනීමේ පහසුව සඳහා යම් සම්මත මාතෘකාවක් භාවිතා කරන ලෙස නිර්දේශ විය හැකිය.

### රුක් රෝපණය සහ රැකබලාගැනීම.

රුක් රෝපණය සහ ඒවා රැකබලාගැනීම සිංහයින් සහ ලියෝවරුන් විසින් කරනු ලබන ජනප්‍රිය ක්‍රියාකාරකම් වේ. මෙහිදී සේවාලාභින් ගණන තීරණය කිරීම දුෂ්කර වේ. මෙහි සේවාලාභින් සංඛ්‍යාව ප්‍රදේශයේ විශේෂඥයින් හා එක්ව ගණනය කළ හැකිනම් එය වාර්තා කල හැකිය. එසේ නැත්නම් රෝපණය කරන ලද සහ රැකවරණය දුන් ගස් ගණන වාර්තා කළ හැකිය. සිංහ ජාත්‍යන්තරය සේවාලාභින් ගණනය සඳහා ගෝලීය සම්මතයන් යොදාගනු ඇත.

### බහු සේවා ක්‍රියාකාරකම් හෝ ව්‍යාපෘති.

ක්‍රියාකාරකම් එකකට වැඩි සංඛ්‍යාවක් එකවිට ක්‍රියාත්මක කරන අවස්ථාවන් බහු සේවා ක්‍රියාකාරකම් හෝ ව්‍යාපෘති ලෙස සැලකේ. සිංහ ජාත්‍යන්තරයට හෝ දිස්ත්‍රික්කයට වාර්තා කළ යුත්තේ ක්‍රියාකාරකම් මිස ව්‍යාපෘති නොවේ. ව්‍යාපෘතියක සේවාව වාර්තා කිරීමේදී

එක්කෝ ප්‍රධානතම ක්‍රියාකාරකම තෝරාගෙන එය පමණක් වාර්තා කළ හැකිය. නැතහොත් එක් එක් ක්‍රියාකාරකම වෙන් වෙන් වශයෙන් වාර්තා කළ හැකිය.නිදසුනක් ලෙස දෘෂ්ඨි පරික්ෂාව, දන්ත සායනය සහ දියවැඩියා  පරික්ෂාව යන ක්‍රියාකාරකම් තුනම එක් ව්‍යාපෘතියක් ලෙස සිදුකරන ලද අවස්ථාවකදී, ඒවා වෙනස් ක්‍රියාකාරකම් තුනක් ලෙස වාර්තා කල හැකිය.

## ප්‍රධාන ක්‍රියාකාරකම් (Signature Activities).

ප්‍රධාන ක්‍රියාකාරකමක් යනු සිංහ සමාජයක්, දිස්ත්‍රික්කයක් හෝ බහුමණ්ඩලයක් විසින් තම සුවිශේෂී ශක්තීන් සහ හැකියාවන් යොදාගනිමින් තම ප්‍රජාවට සේවය කිරීම සඳහා සිදුකරනු ලබන පුනරාවර්තී ක්‍රියාකාරකමකි. මේවා සිංහ සමාජයක, දිස්ත්‍රික්කයක හෝ බහුමණ්ඩලයක සුවිශේෂී අනන්‍යතාවෙහි කොටසක් වේ. යම් ක්‍රියාකාරකමක් තම ප්‍රධාන ක්‍රියාකාරකම ලෙස වාර්තා කිරීමට හැකියාව ඇති අතර මේවා වාර්තා කිරීමේ ක්‍රියාවලියෙහි වෙනසක් නැත.

## සේවා වාර්තා කිරීමේ සීමාවන් (Caps).

අපගේ සේවා වාර්තාකරණෙහි නිවරදතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීමේ වගකීම දරන්නේ සිංහ ජාත්‍යන්තරයයි. එබැවින් පහත දැක්වෙන පරිදි, එක් සේවා ක්‍රියාකාරකමක් වාර්තා කළ හැකි උපරිම සීමාවන් අනුගමනය කල යුතුය.

- සේවාලාභීන් ගණන: 3 000
- ස්වේච්ඡා පැය ගණන: 1 200
- පරිත්‍යාග කරන ලද අරමුදල්: 200 000 USD
- රැස්කරන ලද අරමුදල්: 250 000 USD

සිංහ ජාත්‍යන්තරය මෙම සීමාවන් පනවා ඇත්තේ පහත සඳහන් අවශ්‍යතාවයන් උදෙසාය:

- ප්‍රමිතික මත අනිසි බලපෑම් ඇතිවිය හැකි සංඛ්‍යානමය වශයෙන් අදාල නොවන දත්ත ඉවත් කිරීම.
- දෝෂයන්ට සහ වැරදි ගණනයන්ට තුඩුදෙන සංඛ්‍යාවන් පිළිබඳව පරික්ෂාකාරී වීම.
- අතිශයෝක්තිමත් සංඛ්‍යාවන් වාර්තා කිරීම තුලින් කීර්තියට ඇතිවිය හැකි අවධානම අවම කිරීම.